# BELIEVERS EASTERN CHURCH
## Office of the Metropolitan, Synod Secretariat, St. Thomas Community, Thiruvalla, Kerala, India.

### එඬේර හසුන

සියලු අගරදගුරුතුමන් සහ රදගුරුතුමන්, පූජකතුමන් සහ ඩීකන් පියතුමන්, ඉවැන්ජලිස්තතුමන් සහ සහෝදරියන් සහ බිලීවර්ස් ඊස්ටන් චර්ච්හි ලොව පුරා සිටින විශ්වාසිකයින් හට පියාණන් වහන්සේගේ ද, පුත්‍රයාණන් වහන්සේගේ ද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ ද නාමයෙන් ආසිරි සහ ආචාරය - ආමෙන්.

ක්‍රිස්තුන් වහන්සේ තුළ සෙනෙහෙවතුනි,

අපි නොවැම්බර් මාසය අවාසනයට ළඟා වී ඇති අතර දෙසැම්බර් මාසය පිළිගැනීමට සූදානම් වන්නෙමු, එබැවින් මෙම මාස දෙකෙහිම ඇති වැදගත්කම පිළිබඳව සිහිපත් කිරීම වැදගත් වනු ඇතැයි සිතමි. නොවැම්බර් මාසයේදී නව ජන වන්දනා වර්ෂය ආරම්භ වන අතර, දෙසැම්බර් මාසය යනු අපගේ ජන වන්දනා දින දර්ශනයේ ඇති ඉතා වැදගත්ම සිදුවීමක් වන ක්‍රිස්තුන් වහන්සේගේ උපත සමරණ කාලය වේ.

අප භාවිතා කරන පොදු දින දර්ශනයට වඩා, දෙවියන් වහන්සේගේ ජනතාව ලෙස අපගේ ජීවිතය සහා දින දර්ශනය වටා හැඩ ගැසී ඇත. අප අතර සිටින සමහර පුද්ගලයින්ට දිනපතා ශුද්ධ ලියවිල්ල කියවීම, පවුලක් ලෙස යාච්ඤා කිරීම, දිනපතා පසුතැවිලි වීම, ස්වාමින් වහන්සේට දසයෙන් කොටස් දීම, සභා දින දර්ශනය සහ එහි සිද්ධාන්ත පිළිබඳව නිරීක්ෂණය කිරීම, අන් අයව රැකබලා ගැනීම, විනය වර්ධනය කර ගැනීම, වැනි තවත් අවශ්‍යතා ලැයිස්තුවක් තිබිය හැකිය.

මෙම ආධ්‍යාත්මික ශික්ෂාවන් සඳහා විශ්වාසවන්තව කැපවී ඒවා ඔබේ ජීවිතයේ කොටසක් බවට පත් කර ගැනීමට ස්ථිරව කැපවන ලෙසට මම ඔබව දිරිමත් කරමි. මේ සියල්ලටම යතුර නම් සභා දින දර්ශනය විශ්වාසවන්තව භාවිතා කිරීමය. එමගින් ඔබට මේ දේවල් පවත්වාගෙන යාම වඩාත් පහසු වනු ඇත. අපගේ ආධ්‍යාත්මික ජීවිතය පවත්වාගෙන යාම සඳහා සභාව මගින් නියම කරනු ලැබූ සියලුම උපවාස සහ සැමරුම් (මංගල්‍යයන්) මෙම සභා දින දර්ශනයේ ඇතුළත් කර ඇත. සභා දින දර්ශනය සැලසුම් කර ඇත්තේ අපගේ ස්වාමින් සහ ගැළවුම්කරු වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ භූමික ජීවිතයේ වැදගත් සිදුවීම් අනුස්මරණය කිරීම සඳහා වන අතර එය ආරම්භ වන්නේ ප්‍රකාශ කිරීමේ කාලයෙනි. එහි විශේෂිතම අවස්ථාව වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ උපත සමරණ නත්තල් උත්සවය වේ.

නත්තල බලාපොරොත්තුව, සාමය සහ ප්‍රීතිය පිළිබඳ ඉතා බලවත් පණිවිඩයක් රැගෙන යයි. දෙවියන් වහන්සේගේ අති මහත් ප්‍රේමය සහ ගැළවීම පිළිබඳව මෙනෙහි කිරීමට එය අපට උපකාර කරයි. උත්පත්ති රාත්‍රියේදී දේවදූතයා එඬේරුන්ට කළ ප්‍රකාශය තුළින් එම හැඟීම මනාව ග්‍රහණය කරයි: "එහෙත් දේව දූතයා ඔවුන්ට කතා කොට, "බිය නොවන්න; මෙන්න සකල ජනයා හට ඉතා ආනන්දජනක මංගල පුවතක් මම ඔබ වෙත ගෙනෙමි. මක්නිසාද ස්වාමින් වන ක්‍රිස්තුන් නම් ගැළවුම්කාරයෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේ ය. රෙදි වලින් ඔතා ගව ඔරුවක සතප්වා සිටින බිළිදෙක් ඔබට සම්බ වන්නේ ය. එය ඔබට සලකුණ ය" යි කීය." ශුද්ධවර ලූක් 2:10-11) මෙය දේවදූතයා ප්‍රකාශ කළ පරිදි, අප සියලු දෙනාගේම හදවත් ප්‍රීතියෙන් සහ බලාපොරොත්තුවෙන් පුරවන සුභාරංචියකි. දෙවියන් වහන්සේ අපගේ මනුෂ්‍ය ඉතිහාසයට එකතු වී එම්මානුවෙල් බවට පත්විය. දෙවියන් වහන්සේ අප සමගය, එය ශුද්ධ ලියවිල්ලේ මෙසේ සඳහන් කොට තිබේ; "ධර්මයාණෝ මාංසගත ව අප සමග වැඩ විසූ සේක." (ශුද්ධවර ජොහන් 1: 14(අ)) දේව දූතයින්, මායාකරුවන් සහ එඬේරුන් ක්‍රිස්තුන් වහන්සේගේ උපත පිළිබඳ සුභාරංචිය සඟවා නොගත් අතර, ක්‍රිස්තුන් වහන්සේගේ උපත පිළිබඳ සත්‍යය සහ තම අත්දැකීම ඔවුන්ට හමුවන සියලු දෙනා හටම ප්‍රකාශ කළේය. මෙම නත්තල් කාලයේදී, ප්‍රීතිය සහ සැමරුම් දේවස්ථානයේ බිත්තිවලින්, අපගේ නිවෙස් වලින් සහ හදවත් වලින් ඔබ්බට ගොස් අපගේ කොටසක් වන ප්‍රජාව වෙත ව්‍යාප්ත කිරීමට කටයුතු කරන්න.

නත්තල් දිනය මූලික කරගෙන, ලොව පුරා සිටින ඕතඩොක්ස් කිතුණුවන් උත්පත්ති හෝ නත්තල් උපවාසය පවත්වනු ලබයි. දේව පුත්‍රයාණන් මාංසවත්ව අපගේ ස්වරූපය ගත් එම ආශ්චර්යමත් සිදුවීම පිළිබඳව යාච්ඤාවෙන් මෙනෙහි කිරීමට අපට උපකාරී වන කාල පරිච්ඡේදය මෙය වේ. මෙම උපවාසය තුළින්, ක්‍රිස්තුන් වහන්සේ අපගේ ස්වරූපයට සමාන වූ ආකාරයෙන්, අපද ඔවුන් වහන්සේ හා සමාන

වීමට අභ්‍යන්තරව සහ බාහිරව සූදානම් වෙමු. එය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇති අපගේ කැපවීම අලුත් කර ගැනීමට කරන ආරාධනාවකි - මේ අපගේ ජීවිතයේ සමබරතාවය රැක ගැනීමටත්, සාමය සහ ශුද්ධකම නැවත ඇති කර ගැනීමටත් ඇති කාල වකවානුවයි.

බොහෝ විට අප සිතන්නේ උපවාසයේ නිරත වීම යනු ආහාර ගැනීමෙන් වැළකී සිටීම ලෙසය. නමුත් ශුද්ධවර ජෝන් ක්‍රිසොස්ටම්තුමා අපට අවවාද කරන්නේ " පුද්ගලයෙකු ආහාර ගැනීමෙන් වැළකී සිටීම උපවාසයේ නිරතවීමක් ලෙසින් සිතීම වැරදිය. සැබෑ උපවාසය නම් සියලු නපුරෙන් වැළකී සිටීමය. එබැවින් මෙහි ඇති වැදගත් කරුණ වන, නිරාහාරව සිටින අතරම, පාපයෙන්, කේලාම් කීමෙන්, ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් වැළකී සිටිය යුතු බවත් එය අපට අභියෝගයක් වන බවත් අප මතක තබා ගත යුතුය."

සභාවක් වශයෙන්, සභා දින දර්ශනයට සහ එහි අඩංගුවන විවිධ විශේෂිත අවස්ථාවන් සඳහා සහභාගි වෙමින් ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස එකට එක්ව ජීවත් වීමට මෙම සියලු අවස්ථාවන් ප්‍රයෝජනයට ගනිමු. සභාවේ වැඩ කටයුතු වලට ක්‍රියාකාරී දායකත්ව ලබා දෙමින්, දේවස්ථානයේ බිත්තිවලින් ඔබ්බට ගොස් සභා මෙහෙවරෙහි සමෘද්ධිමත් වීමටත් අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ හා සමාන වීමටත් මෙම නව ජන වන්දනා වර්ෂයේදී හැකියාව ලැබේවා!

සර්වබලධාරී දෙවියන් වහන්සේගේ සාමය සහ කරුණාව ඔබ සමග සදහටම පවතීවා!

ක්‍රිස්තුන් වහන්සේ තුළ ඔබගේ පියාණන්,



මෝරන් මෝර් ඇතනේසියස් පළමු යොහාන්
මෙට්‍රොපොලිටන් හිමිපාණන්. දිනය : 2023-11-20

**සැ.යු: කරුණාකර මෙය සියලුම ප්‍රාදේශීය භාෂාවන්ට පරිවර්තනය කර විශ්වාසිකයින් දිරිගැන්වීම සඳහා සියලුම දේවස්ථාන වල කියවීමට කටයුතු කරන්න.**